# තරණය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය 2025 - දෙවන කලාපය

## නිලධාරි ධාරිතා සංවර්ධනය වෙනුවෙන් පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂන ආයතනයේ පුහුණු, පර්යේෂන හා සංවර්ධන නිලධාරින්ගේ පර්යේෂන කුසලතා ඉහළ නැංවීමේ අරමුණින් 'පර්යේෂණ ක්‍රමවේදය' පිළිබඳ පුහුණු වැඩසටහන අධ්‍යක්ෂකතුමියගේ මුලිකත්වයෙන් 2025.04.08 වන දින පිළිමතලාව අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදි. පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමිය ඇතුළු කාර්යය මණ්ඩලය මේ සඳහා සහභාගි වු අතර සම්පත්දායකත්වය පේරාදේණිය විශ්ව විද්‍යාලයේ ජෙෂ්ඨ කථිකාචාර්යය හා අචාර්යය ප්‍රියදර්ශනි ප්‍රේමරත්න මහත්මිය විසින් ලබා දෙන ලදි.









## වෙබ් අඩවි නවීකරණය හා යාවත්කාලීන කිරීම උදෙසා

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල වෙබ් අඩවි භාර නිලධාරින් සමඟ අමාත්‍යාංශ ලේකම්තුමිය විසින් 2025.04.10 දින සාකච්ඡාවක් පැවැත්විණි. වෙබ් අඩවි නවීකරණය කරමින් යාවත්කාලීන කළ යුතු ආකාරය සාකච්ඡා කළ අතර මෙම අවස්ථාවට අතිරේක ලේකම් (පාලන) සහ අමාත්‍ය මාධ්‍යය ලේකම් ද සම්බන්ධ විය.





## ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පුහුණුව වැලිගමට.......

2025.04.24 හා 25 යන දෙදින වැලිගම ප්‍රජා ශක්ති සංවිධානයේ ව්‍යවසායකයින් බලගැන්වීම සඳහා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පුහුණුව පවත්වන ලදි. පුහුණු හා පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්.එච්.සිරිසේන මහතා සහ පුහුණු හා පර්යේෂණ නිලධාරී චම්පා අල්විස් මහත්මිය, පුහුණු හා පර්යේෂන නිලධාරී මංගලිකා වනසුන්දර මහත්මිය විසින් පුහුණුව සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදි.







## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ආරච්චිකට්ටුවට

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබගැන්වීම් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට අදාළ ආරච්චිකට්ටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පලුගස්වැව වත්තේ මධ්‍ය පරිපාලන ගොවිපළ ආරම්භ කිරිම සඳහා 2025.05.15 දින ආරච්චිකට්ටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදි. ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබගැන්වීම් අමාත්‍යාංශය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් නාලිකා පියසේන මහත්මිය ඇතුළු රාජ්‍ය නිලධාරින් මෙම පුහුණුව සඳහා සම්බන්ධ වන ලදි.








## 2025 වෙසක් මහෝත්සවය ..........

ශ්‍රී බුද්ධ වර්ෂ 2569 වන වෙසක් මහෝත්සවය ‘හජේන මිත්තේ කළ්‍යාණෙ - හජේන පුරිසුත්තමෙ’ යන තේමා පාඨය මුලික කරගනිමින් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ද බෞද්ධ කොඩිය ඔසවා ආයතන පරිශ්‍රය අලංකාර කරන ලදි. වෙසක් සතිය නිමිත්තෙන් සත්කාරක වැඩසටහනක් වික්ටෝරියා වැඩිහිටි නිවාසයේදී 2025.05.16 දින පවත්වන ලදි. මේ සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ඇතුළු නිලධාරින් මේ සඳහා දායකත්වය සපයන ලදි.







## ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයට නව ලේකම්වරයෙක්

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයට නව ලේකම්වරයා ලෙස ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ හිටපු ලේකම් සම්පත් මන්ත්‍රීනායක මහතා ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් පත් කරන ලදි. එයට අදාළ පත්වීම් ලිපිය ජනාධිපති ලේකම් ආචාර්යය නන්දික සනත් කුමානායක මහතා විසින් 2025.05.20 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදි පිළිගන්වන ලදි.



## ආයතනයේ නිලධෙබ් අඩවි යාවක්තාලීන කිරිම පිළිබඳ පුහුණුව

අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල මාධ්‍ය නිලධාරින් සඳහා දින පුහුණු වැඩමුළුවක් 2025.05.23 වන දින පවත්වන ලදි. සෑම ආයතනයකටම Facebook ගිණුමක් හා YouTube ගිණුමක් සකස් කර ගැනිමේ අරමුණින් පැවති මෙම වැඩමුළුව සඳහා අමාත්‍ය ලේකම්, මාධ්‍ය ලේකම් හා සහකාර ලේකම් ජීවන්ති මෙනවිය ද මේ සඳහා සහභාගි වන ලදි. ලේක් හවුස් ආයතනයේ කතෘ මණ්ඩල අධ්‍යක්ෂ සිසිර යාපා මහතා සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී චින්තක මහතා, දෙමළ භාෂා පරිවර්තක මොහොමඩ් ක්‍රිෂ්වාන් මහතා විසින් ද සම්පත් දායකත්වය ලබා දෙන ලදි.







## නිලධාරීන් උදෙසා ආකල්ප සංවර්ධනය ...........

2025.05.23 හා 24 යන දෙදින ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාතයාංශයට අයත් නිලධාරීන් සඳහා ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහනක් පවත්වන ලදි. මෙම පුහුණුව සඳහා සම්පත් දායකත්වය Dream Force – Sri Lanka සිහින බලකාය කණ්ඩායම හා රංගන ශිල්පී ප්‍රසන්නජිත් අබේසූරිය මහතා ඇතුළු සංගීත කණ්ඩායම විසින් ලබා දෙන ලදි.

මෙම පුහුණුව සඳහා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(පාලන) රාධා නානායක්කාර මහත්මිය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂන හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජී.ජී.ඩී.කුමාර මහතා සහ ග්‍රාමීය සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය හා ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශලයා මහත්මිය හා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ගණකාධිකාරි අයි.එම්.අයි.සී.ඉලංගකෝන් මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, රියදුරු මහතුන් ද මෙම පුහුණුව සඳහා සහභාගි වන ලදි.














## ජගත් පරිසර දින සැමරුම

2025.06.05 වන දින ජගත් දින පරිසර දින සැමරුම් වැඩසටහනට සමගාමීව ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මිය ඇතුළු කාර්යය මණ්ඩල නිලධාරින් විසින් රුක් රෝපණ වැඩසටහනක් හා පරිසරය පිරිසිදු කිරිමේ වැඩසටහනක් ද පවත්වන ලදි.













## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා වන පුහුණු වැඩසටහන

2025.06.11, 12 හා 13 වන දින පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී තෙදින නේවාසික පුහුණුව පවත්වන ලදි. පුහුණුව සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂන ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය සහ පිළිමතලාව පුහුණු මධස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මිය ද සහභාගි වන ලදි. පුහුණුව සඳහා ඒකාබද්ධ ග්‍රාමසංවර්ධන වැඩසටහන්වලට අදාළ තෝරාගත් වසම්වල ව්‍යාපෘති සිදු කරන සංවර්ධන නිලධාරින්, ග්‍රාමනිලධාරින්, සමෘද්ධි සංවර්ධන නිලධාරින් මේ සඳහා සහභාගි වන ලදි. පුහුණුලාභින් විසින් ඒකාබද්ධ ග්‍රාමසංවර්ධන වැඩසටහනට අදාළව තෝරා ගත් වසම් වල ව්‍යාපෘති පිළිබඳ කණ්ඩායම්ගත අභ්‍යාසයක් සිදු කර ඉදිරිපත් කිරීම් (presentation) සිදු කරන ලදි. පුහුණුව සඳහා සම්පත්දායකත්වය පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මිය හා පේරාදේණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය , අචාර්යය ප්‍රියදර්ශනි ප්‍රේමරත්න මහත්මිය විසින් ලබා දෙන ලදි පුහුණුව සම්බන්ධීකරණ කරන ලද්දේ සංවර්ධන නිලධාරී සංවර්ධන නිලධාරී ආනන්ද ප්‍රේමසිරි මහතා, ප්‍රදිප් ලංකාපෙළ මහතා සහ සංවර්ධන නිලධාරී නිවර්තනා විතානගේ මහත්මිය විසිනි.













## ප්‍රජා ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය ඇළහැරට........

2025.06.17,18 හා 19 තෙදින ප්‍රජා ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය පුහුණු වැඩමුළුව සංවර්ධන නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන් 40කුගේ සහභාගිත්වයෙන් ඇළහැර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදි. මේ සඳහා සම්පත් දායකත්වය ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පුහුණු හා පර්යේෂණ නිලධාරී එස්.එම්.යු.බී.සමරකෝන් මහතා විසින් සිදුකල අතර වැඩමුළුවේ සම්බන්ධීකරණ කටයුතු සංවර්ධන නිලධාරී පසන් සක් වැත්තෑව මයතා විසින් සිදු කරන ලදි.









## සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය මහකුඹුක්කඩවල හා මාදම්පේට........

මහකුඹුක්කඩවල සහ මාදම්ලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් පරිපාලන ග්‍රාම නිලධාරි, සමෘද්ධි කළමනාකරු, ග්‍රාමසංවර්ධන නිලධාරින්, සංවර්ධන නිලධාරින්, ආර්ථික සංවර්ධන නිලධාරින් ග්‍රාම නිළධාරින් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ සහභාගිත්වයෙන් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය පුහුණු වැඩමුළුව 2025.06.24, 25 හා 26 පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. මේ සඳහා සම්පත් දායකත්වය ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්. කෞශල්‍යා මහත්මිය, පුහුණු නිලධාරී ප්‍රදිප් ලංකාපෙළ මහතා සහා පුහුණු නිලධාරී නිරෝෂා විජේවර්ධන මහත්මිය විසින් සිදු කරන ලදි. සංවර්ධන නිලධාරි මල්ෂානි ආනන්ද මෙනවිය විසින් පුහුණුවේ සම්බන්ධිකරණ කටයුතු සිදු කරන ලදි.













## 2025 වර්ෂයේ අපෙන් ඔබට........

- සමාජ සජීවීකරණය
- ව්‍යාවසායකත්ව කුසලතා සංවර්ධනය
- ප්‍රජා සහභාගිත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය
- ගෘහ කළමණාකරණය හා පවුල් සංවර්ධනය
- සහභාගිත්ව නායකත්ව කුසලතා සංවර්ධනය
- ප්‍රජාමූල සංවිධාන කළමණාකරණය
- පුහුණු වැඩසටහන් සැලසුම්කරණය හා කළමණාකරණය
- විපර්යකාරක පුහුණුකරු පුහුණුව

**උපදේශකත්වය**

තිළිණි සුරංගිකා
කරස්නාගොඩ
අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය

ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය

එම්.එස්.එස්. නස්ලි
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය

**සංස්කාරක**

එච්.එම්.පී.කේ.නවරත්න
සංවර්ධන නිලධාරී
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය









